*සිංහල භාෂාවට පරිවර්තන කල පිටපතකි*

**උතුරු පළාත් රා.සේ.කො.සභා චක්‍රලේඛ අංක:** 21/2024

මගේ අංකය: **NP/07/10/04/81**
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
උතුරු පළාත.
22.07.2024

අමාත්‍යාංශයේ ලේකම්වරු, උතුරු පළාත
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්, උතුරු පළාත
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**උතුරු පළාත් තාක්ෂණ සේවයේ I වන ශ්‍රේණියේ නිලධාරීන් විශේෂ ශ්‍රේණියට උසස් කිරීමේ සීමිත තරග විභාගය- 2021/2022/2023**

12.01.2016 දිනයේ ගරු ආණ්ඩුකාර තුමා විසින් අනුමතකළ 01.06.2013 දිනය සිට ක්‍රියාත්මක වන උතුරු පළාත් ධාක්ෂණ සේවයේ නිර්දේශකළ සේවා ව්‍යවස්ථාවට අනුකූලව උතුරු පළාත් ධාක්ෂණ සේවයේ I වන ශ්‍රේණියේන් විශේෂ ශ්‍රේණියට උසස්කිරීම සඳහා සීමිත තරග විභාගය ශ්‍රීලංකා විභාග කොමසාරිස් ජනරාල් විසින් **2024 නොවෙම්බර්** මාසයේ කොළඹ දී පැවැත්වනු ලැබෙන ලෙස මෙහින් දන්වමි.

ඉල්ලුම් පත්‍රය ශ්‍රීලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ 'Our services "යටතේ ඇති "Online Applications-Recruitment Exam/E .B Exams" මගින් පළ කරන ලද සජීවි මාර්ගගත ක්‍රමය (online) මගින් පමණි ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කළ හැක. 2024.07.15 දිනයේ පෙ.ව 9.00 සිට 2024.08.15 දිනයේ ප.ව 9.00 දක්වා සජීවි මාර්ගගත ක්‍රමයෙ (online) ඉල්ලුම් පත්‍රය බාරගනු ලැබේ.

ශ්‍රීලංකා විභාග දෙපාර්තමේන්තු විසින් ලබාදුන් උපදේශ්පරිදි ඉල්ලුම් පත්‍ර සජීවි මාර්ගගත ක්‍රම සේවාවෙන් (online) ඉදිරිපකලෙන්පසු එම මුද්‍රිත (Print) පිටපත බාකර ඒ පිටපත අපෙක්ෂකයන් තමන්ගේ අත්අකුරෙන් සුදුසු කොටස් සම්පූර්ණකළ හා අත්සන් තබා තමන්ට අදාල දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සහතික කළයුතුයි. එම ලේකනය නිලධාරීන් තම දෙපාතමේන්තු ප්‍රධානියා විසින් **ලේකම්තුමා' පළාත් 'රාජ්‍ය සේවා කොමිෂන් සභාව උතුරු පළාත 393/48 කෝවිල පාර නල්ලූර් යාපනය'** යන ලිපිනයට 2024.08.15 දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි. ඉල්ලුම් පත්‍ර එවන ලියුම් කවරයේ වම් පැත්තේ ඉහල කොණේ විභාගයේ නම් සඳහන් කළ යුතුයි. ඉල්ලුම් පත්‍ර බාර ගන්න අවසන් දිනෙන් පසුව ලැබෙන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කෙරෙයි.

2 . 2021.12.31 හෝ .2022.12.31 හෝ .2023.12.31වන දිනයේ පහත සඳහන් සුදුසුකම් සම්පූර්ණකළ ඇති නිලධාරීන්

හෝ

ඉහත සඳහන් කිසියම් දින දෙකෙන්

හෝ

ඉහත සඳහන් දින තුනේන් සුදුසු අය විභාගය සඳහා ඉල්ලුම් කිරීමට හැකි වේ.

(i) උතුරු පළාත් ධාක්ෂණ සේවයේ අධීක්ෂණ කළමනාකර සහකාර සේවා කාණ්ඩයේ 1 වන ශ්‍රේණියේ අවම වසයෙන් වසර පහතුල (05) කැමැත්තෙන් හා තෘප්තිමත් සේවාව සම්පූර්ණ කළ අදාල වැටුප් වැර්ධකය පහක් (05) ලබා අති **තව ද**

( ii) උසස්වන දිනට පෙරාදුව එළඹු වසර පහතුල (05) තෘප්තිමත් සේවාව සම්පූර්ණ කළ **තව ද**

(iii) රාජ්‍ය සේවා කොමිසම් සභාවෙ 1/2020 අංක දරණ චක්‍රලේකයේ විධිවිදාන වලට අනුකූලව කිසිදු විනයානුකූල දණ්ඩුවම් නොලැබු කෙනෙක් වියයුතුයි. **තව ද**

(iv) 3 වන කඩඉම් විභාග සමත් වූ නිලධාරීන් මෙම විභාගයට ඉල්ලුම් කිරීමට සුදුසුකම් ලැබෙ.

3. විශේෂ ශ්‍රේණියේ නිලධාරීන් සඳහා පහත සඳහන් වැටුප් ක්‍රමය බලපැවෙත්වේ.

( MN- 7 2016 4 වන පියවර ) රු 43,845 - 8*755-18*1030-රු 68425

4. උතුරු පළාත් ධාක්ෂණ සේවයේ I වන ශ්‍රේණියේ සිට විශේෂ ශ්‍රේණියට උසස් කිරීම පහත පරිදි වේ.

(i) **බඳවා ගන්නා ප්‍රතිශතයන්**
සීමිත පදනම- 40%
සේවා පළපුරුද්ද හා කුසලතා 60%

(ii) අනුමත තනතුරු සංඛ්‍යාව 04 ක් වනවිට සීමිත තරඟ විභාගය යටතේ බඳවාගනු ලබන ප්‍රතිශතය 25% හා සේවා පළපුරුද්ද හා කුසලතා යටතේ බඳවාගනු ලබන ප්‍රතිශතය 75% විය යුතු අතර අනුමත තනතුරු සංඛ්‍යාව 03 ක් වනවිට ඉහත සීමිත තරඟ විභාගය යටතේ බඳවාගනු ලබන ප්‍රතිශතය 33.33% හා සේවා පළපුරුද්ද හා කුසලතා යටතේ බඳවාගනු ලබන ප්‍රතිශතය 66.66% විය යුතුයි.

(111) උතුරු පළාත් ධාක්ෂණ සේවයේ විශේෂ ශ්‍රේණියේ පුරප්පාඩු සංඛ්‍යාව 04 කට වැඩිනම් ඉහත 4(i) හි සඳහන් ප්‍රතිශතයන්ට යටත් ව සීමිත තරඟ විභාගයේ ප්‍රතිඵල මත පුරප්පාඩු පිරවීම සිදු කළ යුතුයි.

iv ) උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිසම් සභාවේ ලේකම් වෙනුවෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන විශේෂ ශ්‍රේණියට උසස් කිරීමෙ සීමිත තරඟ විභාගයේ ප්‍රතිඵල මත සමත්වන්නන් අදාල සෙසු අවශ්‍යතා සම්පූර්ණකර ඇති වන විට උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිසම් සභාව විසින් පත්කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙ පරීක්ෂණයක් මගින් තහවුරු කර ගැනීමෙන් පසු විභාගයෙ කුසලතා අනුපිළිවල මත සහ පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව විභාගය පැවැත්වූ දිනයේ සිට ක්‍රියාත්මක වන පරිදි විශේෂ ශ්‍රේණියට උසස් කිරීම උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිසම් සභාව විසින් සිදු කරනු ලැබේ.

V ) මෙම විභාගයේ ප්‍රතිඵලය වෙනවෙනම එක් එක් වර්ෂවල පැවති පුරප්පාඩු සංඛ්‍යාව පිරවීමට අදාල කර ගනු ලැබේ. එහිදි ඒ ඒ වර්ෂවල පැවති පුරප්පාඩු ඇතිවූ දිනයන්ට සුදුසුකම් ලැබූ නිලධරයන් ලකුණු අනුපිළිවල අනුව තෝරාගනු ලබන අතර විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සිදු කරන දිනය ලෙස සලකනුයේ එම විභාගය පැවැත්වූ දිනයෙ වේ.

vi ) විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සඳහා වූ සීමිත තරඟ විභාගයේ ප්‍රතිඵල අදාලකර ගත යුතු වන්නේ 2021, 2022 සහ 2023 වර්ෂවල පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව පිරවීමට පමණි.

vii ) මෙම විභාගයේ ප්‍රතිඵලය මත උතුරු පළාතේ ධාක්ෂණ සේවයේ විශේෂ ශ්‍රේණියේ 2021.01.01 දින සිට 2021.12.31 දින දක්වා සහ 2022.01.01 දින සිට 2022.12.31 දින දක්වා සහ 2023.01.01 දින සිට 2023.12.31 දින දක්වා එක් එක් දෙපාර්තමේන්තුවල හා අමාත්‍යාංශවල ඒ ඒ තනතුරේ පවතින පුරප්පාඩු අනුව පුරවනු ලැබේ.

**5 අයදුම්කරුගේ අනන්‍යතාවය සනාථ කිරීම**

(i) අයදුම්කරු විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයන් සඳහා ම අධීක්ෂකයන් සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාවය සනාථ කල යුතුයි.ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් විභාග අධීක්ෂකයන්වෙතට ඉදිරිපත් කළ යුතුයි.

අ) ජාතික හැඳුනුම් පත.
ආ) වලංගු විදේශ ගමන් බල පත්‍රය.
ඇ) වලංගු ශ්‍රී ලාංකික රියතුරු බල පත්‍රය.

(ii) එමෙන්ම විභාග අපේක්ෂකයන් අනන්‍යතාවය තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුයි. එසේ නම අනන්‍යතාවය සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ.තවද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී එතැනින් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනාගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

**06 අයදුම් කිරීමෙ ක්‍රමය.**

(i) මාර්ගගත (online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූරාණ කළ යුතුය. අයතුම්කරුවන් විසින් මාර්ගගතව සිදුකරණ ලද මෘදු පිටපත හා ලියාපදිංචි තැපෑලෙන් යොමු කරන ලද මුද්‍රිත පිටපත (Print out) යන දෙතම විභාග දෙපාර්තමේන්තුවට ලැබුණුපසු එම මෘදු පිටපත හා මුද්‍රිත පිටපත සත්‍යාපනය කිරීම සිදුකරනු ලබන අතර භාර ගන්නා ලද බව /භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිතා කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවිඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් ලිපිනයට (E Mail) හෝ දැනුම් දෙනු ලැබේ.මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති උපදෙස් පත්‍රිකාව (Instruction) බාගත කර ගන්න. අයදුම්පත පිරවීමේ දී එම උපදෙස් තරයේ පිළිපදින්න . අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් ද භාරගනු නොලැබේ.

(ii) අයතුම්කරුවන්ට තම අයතුම්පතේ සදහන් කළ භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.මෙම විභාගය සදහා අයතුම්කරුවන් සිංහල දෙමළ හා ඉංග්‍රිසි යන භාෂා මාධ්‍ය තුනෙන් ම ඉදිරිපත් වුවහොත් එම මාධ්‍ය තුනෙන් ම විභාගය පවත්වනු ලබන අතර අයතුම්කරුවන් විසින් තමා පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍රවලටම එකම භාෂා මාධ්‍යකින් පිළිතුරු සැපයිය යුතු වෙ.

(iii) පළමු වරට මෙම විභාගයට පෙනී සිටින නිලධරයන් විසින් කිසිදු විභාග ගාස්තුවක් ගෙවිය යුතු නොවේ. එසේ වුවත් ඉන්පසු වාරවල දී නිලධරයන් විභාගයට පෙනී සිටින්නේ නම් විභාග ගාස්තුව 600.00 ක් ගෙවිය යුතුයි. විභාග ගාස්තු ගෙවීමේ දී මාර්ගගත පද්ධතියෙන් ලබා දෙන පහත ගාස්තු ගෙවීමෙ ක්‍රමවෙද යටතේ පමණක් ගෙවීම සිදු කළ යුතුය.

1. ඕනෑම බැංකු ණය කාඩ් පතක් මගින් (Any Bank Credit Card)
2. අන්තර්ජාල ගෙවීමෙ පහසුකම සහිත ඕනෑම බැංකු හර කාඩ් පතක් මගින්
   (Any Bank Debit Card with the Facility of Internet Transactions)
3. ලංකා බැංකු ඔන්ලයින් බැංකු ක්‍රමය (Online Banking Method of Bank of Ceylon)
4. ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මගින්(Any Branch of Bank of Ceylon)

**සටහන :-**

අ) ඉහත ක්‍රම මගින් ගෙවීම සිදු කරන ආකාරය පිළිබද උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාල තාක්ෂණික උපදේශ් යටතේ පළ කර ඇත.

ආ) ගෙවීම් ලැබුණු බවට කෙටි පණිවුඩයක් මගින් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් මගින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සදහා වන සම්පූර්ණ මුදලම ගෙවිය යුතු වන අතර විභාග ගාස්තු අඩුවෙන් හො වැඩියෙන් ගෙවා ඇති අයතුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.ඉහත සදහන් ගෙවීම් ක්‍රම මගින් විභාග ගාස්තු ගෙවීමේදී සිදු වන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ.

ඇ) විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් සිදු කරනු නොලැබේ.

7(i) මෙම ගැසට් නිවේධනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් අයදුම්කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් ඇයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර විභාග ගාස්තු ගෙවීම අදාළ නම් ර්ට අදාළ ලදුපත සමහ විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය අයත්වන රාජ්‍ය සේවය අයතුම්කරුගේ අත්සන හා අත්සන සහතික කිරීම ද දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය සහ සහතිකය ද සහිතව නිවැරදිව සම්පූර්ණ කරන ලද ඇයදුම්පත් යොමුකොට ඇති අයතුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාගයට පෙනී සිටින අයදුම්කරුවන් විසින් විභාග අධීක්ෂකවරු වෙත තම අත්සන සහතික කරවා ගත් ප්‍රවෙශ පත්‍ර ඉදිරිපත් කළ යුතුය. එවැනි ප්‍රවෙශ පත්‍ර නොමැතිව විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ.එසේම අයදුම්කරුවකුට විභාග ප්‍රවෙශ පත්‍රයක් නිකුත්කිරීම එම අයදුම්කරු විභාගයට ඉදිරිපත්වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතය.

(ii). අයදුම්කරුවන්ට විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2ක් හෝ 3ක් ගත වූ පසුවත්

ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාව වෙත දන්වා සිටිය යුතුය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා අයදුම් කරන ලද විභාගයේ නම අයදුම්කරුගේ සම්පූර්ණ නම ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවකු නම් එම විස්තර සමඟ ෆැක්ස් මගින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබාගැනීමට හැකි අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් ද සඳහන් කළ ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙතට යොමුකර විමසා සිටීම වඩාත් ඵලදායි වනු ඇත. එසේ විමසීමෙ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරු සනාථ කිරීම සඳහා තමා ළඟ තබාගත් අයදුම්පතේ පිටපත විභාග ගාස්තු ගෙවීම අදාළ නම් රට අදාළ ලදුපතේ පිටපත හා අයදුම්පත තැපැල් කිරීමේ දී ලියාපදිංචි කළ කුවිතාන්සිය සුදානමින් තබා ගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත.

(iii) අයදුම්පතේ ද විභාගය සඳහා වන ප්‍රවේස පත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සහතික කර තිබිය යුතුය.අපේක්ෂකයකු තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී නියමිත අංකය යටතේ විභාගයට පෙනී සිටිය යුතු අතර විභාග දිනයේ තම අත්සන සහතික කරවාගත් ප්‍රවේස පත්‍රය ශාලාපති වෙත භාරදිය යුතුය .තම ප්‍රවේස පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

**8.** ඉහත (7) වන ඡේදයේ සඳහන් කර ඇති අවශ්‍යතාවන් සපුරාලීමට අපොහොසත් වන අයදුම්කරුවන් විසින් පසුව ඉදිරිපත් කෙරෙන ලියවිලි සලකා බලනු නොලැබේ.

**09. විභාග ප්‍රතිපල නිකුත් කිරීම**

මෙම විභාගයේ ප්‍රතිපල පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් නිකුත් කිරීමට කටයුතු කරනු ලැබේ.

**10 . විභාග පටිපාටිය**

මෙම විභාගය සිංහල දෙමළ සහ ඉංග්‍රිසි මාධ්‍යවලින් පැවැත්වෙන අතර අයදුම් කරන මාධ්‍යය පසුව වෙනත් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

(i) I ශ්‍රේණියේ නිලධරයන් විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සඳහා වන විභාගය ප්‍රශ්න පත්‍ර දෙක කින් සමන්විත වේ.

(1) අභියෝග්‍යතා පරීක්ෂණය - කාලය : පැය 01 කි - ලකුණු 100 යි.

(2) කළමනාකරණය - කාලය : පැය 03 කි - ලකුණු 100 යි.

සුසුකම් ලැබීම සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයට අවම වශයෙන් 40% ක ලකුණු ප්‍රමාණයක් අයදුම්කරුවන් ලබාගත යුතු වේ.

**පළමු වන ප්‍රශ්න පත්‍රය සඳහා විෂය නිර්දේශය පහත දැක්වේ :**

**අභියෝග්‍යතා පරීක්ෂණය - විෂය අංකය (1)**

නිලධාරීන් තමා වෙත පැවරෙන කාර්යයන් සාමාන්‍ය කාර්ය සාධන මට්ටම ඉක්මවූ කාර්යක්ෂමතාවකින් යුතුව ඉටු කිරීම සඳහා අවශ්‍ය වන දැනුම කුසලතා හා ආකල්ප අත් පත් කර ගෙන තිබෙ දයන්න හා ඒවා භාවිතයේ දී ඉහළ ප්‍රවීණතාවක් දක්වන්නේ ද යන්න මැන බැලීම පරීක්ෂණයකි බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමෙ මාදිලියේ ප්‍රශ්න 50 කින් යුක්ත වන අතර ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

**දෙවැනි ප්‍රශ්න පත්‍රය සඳහා විෂය නිර්දේශය පහත දැක්වේ.**

**කළමනාකරණය - විෂය අංකය : 2**

(i) කළමනාකරණය මූලධර්ම

(ii) කළමනාකරණ ශ්‍රිත
සැලසුම් කිරීම
තීරණ ගැනීම

තීරණ ගැනීමේ ක්‍රියාවලිය
සංවිධානය
මාණ්ඩලීකරණය
මෙහෙයවීම
අභිප්‍රේරණ ක්‍රියාවලිය
නායකත්වය
පාලනය
පාලනමය ප්‍රතිපත්ති ක්‍රියාවලිය
(iii) සහභාගිත්ව කළමනාකරණය
(iv) කළමනාකරණය පරිසරය
(V) සිද්ධි අධ්‍යයනය.

මෙය ව්‍යුහගත මාදිලියේ ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතුය.

**11.** විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අයදුම්කරුවන් යටත් වේ එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.මෙම නිවේදනයට අදාළ රෙගුලාසි අනුව කිසියම් අපේක්ෂකයකු රට පෙනී සිටීමට නුසුදුසු වෙතැයි පෙනී යන ලද නම් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වන අතර හෝ රට පසු හෝ යන කවර අවස්ථාවක දී වුවද ඔහුගේ / ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

**12.** මෙම නිවේදනයේ විදිවිධාන සලසා නොමැති කවර කරුණක් පිළිබඳව වුව ද උතුරු පළාත් රාජ්‍ය සේවා නිලධාරීන් සඳහා උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ තීරණය ද අවසාන තීරණය වන්නේය.

**13** .තනතුරට අදාළ පුරප්පාඩු පිරවීමේ දී එම පුරප්පාඩු වලින් එක් කොටසක් හෝ සම්පූර්ණයෙන් පිරවීම පිළිබද අවසාන තීරණය උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් කරනු ලැබේ.

**14.** මෙම ගැසට් නිවේදනයේ දෙමළ හා සිංහල භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් ඒවිට දෙමළ භාෂා පාඨය බල පැවැත්වෙන්නේය.

**15.** මෙම ගැසට් නිවේදනයේ සඳහන් තොරතුරු ඔබගේ අමාත්‍යාංශයේ / දෙපාර්තමේන්තුවේ ආයතනයේ සේවය කරන අදාළ නිලධාරීන් දැනුවත් කරන්න ලෙස ඉල්ලා සිටිමි.

**16.** තවද මෙම තොරතුරු උතුරු පළාතේ වෙබ් අඩවිය වන www.np.gov.lk යන ලිපිනයේ Exam & Recruitments → Advertisement මගින් ලබා ගත හැක .

**"මෙම ගැසට් නිවේදනය රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු හා පළාත් පාලන අමාත්‍යාංශයේ අංක 2393 දරණ 2024.07.12 දිනයේ ශ්‍රීලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් නිවේදනයට සාමකාමීව පළ කරන ලදී"**

සි. තිරුවාකරන්
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
උතුරු පළාත්.
22.07.2024

පිටපත : 01 ප්‍රධාන ලේකම් උතුරු පළාත - දැනගැනීම පිනිස යි

02 ආණ්ඩුකාරතුමියගේ ලේකම් උතුරු පළාත - දැනගැනීම පිනිස යි